**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකල විගණන මතය**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට කාශන ප්‍රමූල්‍ය .අනුකූලව මා විගණනය සිදු කරන ලදී (ප්‍ර.වි.ලං.ශ්‍රී) සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇතමාගේ . මාණවත් සහ උචිත මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍ර .බව මාගේ විශ්වාසයයි

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාව නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපි වන බවට ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයය අංක 1003,1101, හා 1303 යටතේ විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශනයේ කිසිදු බැරකමක් දක්වා නොතිබුණු නමුත් 2019 වර්ෂය තුළදී එම වැය විෂයයන් යටතේ පිළිවෙලින් රු.25,574,629, රු.342,792 හා 17,155 ක් 2018 වර්ෂයේ වියදම් වෙනුවෙන් පියවා තිබුණි. | වියදම් නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ | වැය විෂයය අංක 1003 සම්බන්ධව මු.රෙ.115(5) ප්‍රකාරව කටයුතු කර ඇති බවත්, විෂයය අංක 1002 සඳහා 2018 වර්ෂයේ ප්‍රතිපාදන නොතිබුණු හෙයින් මු.රෙ. 94(2) අනුව ගෙවීම් කර ඇති බවත්, විෂයය අංක 1303 සඳහා අග්‍රිම ලබා නොදීම නිසා අත්‍යවශ්‍ය වැය දැරීම් සිදුකරන ලදී. |
| (ආ) | වැය විෂයය අංක 2001 යටතේ විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශනයේ රු.18,430 ක වටිනාකමක් දක්වා ඇතත් 2019 වර්ෂයේ වැය ලෙජරයේ එම වැය විෂයය යටතේ රු.761,640 ක බැරකම් නිරවුල් කර තිබුණි. | වර්ෂයේ වියදම්වලට අදාලව බැරකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කල යුතු වීම. | බැරකම් ප්‍රකාශනය සකස් කිරීමේදී සිදු වූ අතපසු වීමක් හේතුවෙන් 2001 වැය විෂය යටතේ රු.761,640 ක මුදල ඇතුලත් කිරීමට නොහැකි විය. |
| (ඇ) | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුම තුළ වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින එකතු වටිනාකම රු.38,259,348 ක් විය. | තැන්පතු ගිණුමේ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | මෙම තැන්පතු මුදල්වලින් ආරක්ෂක රාජකාරී සඳහා යොදවා ඇති හටයින් වෙනුවෙන් ලද මුදල ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි රඳවා ගෙන ඇති බවත්,එම මුදල වර්ෂ 02 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් කොන්ඩච්චිය ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබුණු කජු වගා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ උපයා තිබුණු මුළු ආදායම රු.58,448,565 ක් විය. එම කාලපරිච්ඡේදය සඳහා හටයින්ගේ වැටුප හැර අනෙකුත් වියදම් රු. 114,104,066 ක් දරා තිබූ අතර ව්‍යාපෘතියේ ආදායම ඉක්ම වූ වියදම රු. 55,655,501 ක් වූයෙන් ව්‍යාපෘතියෙන් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් උපයා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය මගින් ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වීම. | කජු වගාවේ අස්වැන්න උපරිම මට්ටමට ලඟා වීමට වර්ෂ 08 ක පමණ කාලයක් ගත වන අතර ඉදිරි වර්ෂ 03 ඇතුළත වියදම් ආවරණය කර ගත හැකි වනු ඇත. |
| (ආ) | කජු වගා ව්‍යාපෘතිය තුළ අතුරු බෝග වගා කර තිබුණු අතර අතුරු බෝග වගාවේ ශුද්ධ ආදායම 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණු නමුත් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී ශුද්ධ ආදායම රු. 7,337,555 කින් පහළ ගොස් තිබුණි. | පූර්ව කාලගුණික, දේශගුණික තොරතුරු ලබා ගෙන ඊට ගැලපෙන පරිදි අතුරුබෝග වගාවන් ආරම්භ කර පවත්වා ගත යුතු වීම. | ප්‍රදේශයේ පැවති නියං තත්ත්වය හේතුවෙන් අතුරු බෝග වගාවන් විනාශ වී ආදායම් පහල වැටී තිබුණි. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 32001-01-1409 අංක දරන වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු. 600,000 මුදලක් පුනරාවර්ථන වැය විෂයයන් මගින් මාරුකර ගෙන තිබුණු නමුත් එම ප්‍රතිපාදන මුදල උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන මුදල් අදාල වර්ෂය තුළ උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට වවුචර හා බිල්පත් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන |

ඉතිරිවී තිබුණි.

## 2.3 ප්‍රතිපාදන ඉතිරිවීම

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයය 1506 හා 2101 යන වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදනය කර තිබුණු මුදලින් පිළිවෙලින් සියයට 54 ක් හා සියයට 100 ක් වශයෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු පුරෝකථනය සහ වියදම් කළමනාකරණය හැකිතාක් නිවැරදිව කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | රාජ්‍ය දේපල ණය ලබා ගැනීම බලා පොරොත්තු වූ ප්‍රමාණයෙන් සිදු නොවීම, සහ ක්‍රොම්ට්‍රෝලර් ජනරාල්ගේ අනුමැතිය නොලැබීම, යන කරුණු මත ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. |

## 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 94(I) අනුව දරන ලද වැය සහ බැරකම්වල ප්‍රමාණය අදාල වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල් නොඉක්මවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ 2103 දරන වැය විෂය යටතේ ප්‍රතිපාදන ඉක්මවා රු. 499,971 ක් බැරකම්වලට බැඳි තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතුය. | වර්ෂ අවසාන කාලය තුල අග්‍රිම මුදල් ලබා නොදීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අත්‍යාවශයෙන්ම සිදුකළ යුතු කාර්යයන් සපුරා ගැනීම සඳහා බාහිර ආයතන සමග බැඳීම් ඇති කර ගත් බවත් එම ආයතන වෙත බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වීම හේතුවෙන් බැරකම්වලට එළඹීමට සිදුවූ බවත් දක්වා තිබුණි. |

**2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශයක් සහ කාර්යාල 04 ක් විසින් මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත වූ විවිධ කාර්යයන් සඳහා එකතුව රු.136,271,881 ක ප්‍රතිපාදන ප්‍රේෂණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.133,349,697 ක් පමණක් උපයෝජනය කර තිබීමෙන් ප්‍රතිපාදන වලින් රු.2,922,184 ක මුදලක් ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදිත මුදල් අදාල කාර්යයන් වෙනුවෙන් කාර්යක්ෂමව මෙහෙය වීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | භාණ්ඩාගාර අක්මුදල් නියමිත පරිදි නොලැබීම මත මෙසේ ඉතිරි වී පැවතුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

මෝල්පේ ප්‍රදේශයේ ඉදිකිරීම් සිදු කරනු ලබන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ල සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා මූලස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් පූජනීය ස්ථානයකට අයත් අක්කරයක ඉඩමක් වර්ෂ 30 කට බදු පදනමක් යටතේ ලබා ගෙන තිබුණු අතර බදු කාලය ඉක්ම ගිය පසු අදාල ගොඩනැගිලි ඇතුලු දේපල පූජනීය ස්ථානයට හිමි වන පරිදි ගිවිසුම්ගතව තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමට පෙර ඉඩමේ හිමිකාරීත්වය පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම. | වර්තමානයේ භාවිතා කරන ගොඩනැගිලි සඳහා වැය වන කුලියට සාපේක්ෂව වාසිදායක වේ. |
| (ආ) | මෙම ඉදිකිරීම් 2015 සැප්තැම්බර් 15 ආරම්භ කර තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණේ 2017 ජූලි 12 වන දින දීය. මේ සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 16 දින ඉඩම | පූර්ව අනුමැතින් නියමිත පරිදි ලබා ගැනීමට ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | හිමි පාර්ශවය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර ලිඛිත ගිවිසුමකට එළඹ තිබුණි. තවද ගොඩනැගිල්ලේ මූලික සැලැස්ම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. 55,288,834 ක් වූ මූලස්ථාන ගොඩනැගිල්ල මහල් 3 කින් සමන්විතව ඉදිකිරීමට සැලසුම් කර තිබුණු නමුත් ගොඩනැගිල්ලේ පළමු මහලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසුව මහල් 04 කින් යුතු ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීම් සැලැස්ම සංශෝධනය කර තිබුණි. ඒ අනුව රු. 55,288,834 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. 180,689,390 දක්වා වැඩි කර තිබුණි. | අවශ්‍යතාවයන් නිවැරදිව තක්සේරු කර නොතිබීම හේතුවෙන් වන පිරිවැය ඉහල යාම පාලනය කර ගත යුතු වීම. | දෙපාර්තමේන්තු මූලස්ථානය සඳහා ගොඩනැගිල්ලක් නොමැති වීම හේතුවෙන්, ඉදිකරමින් පැවති මහල් 3කින් යුත් ගොඩනැගිල්ල ඒ සඳහා සුදුසු බව තීරණය කිරීමෙන් පසු මහල් 4 ක පරිපාලන සංකීර්ණයක් ලෙස ඉදිකිරීමට තීරණය කර තිබුණි. |
| (ඈ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි බුද්ධි කොට්ඨාශ නිලධාරීන්ගේ සේනා විධායක අරමුදලෙන් රු.12,900,000 මුදලක් මෙම මූලස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා උපයෝජනය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් සේනා විධායක අරමුදලේ එකඟත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | සේනා විධායක අරමුදලේ මුදල් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇති අතර බුද්ධි අංශ සාමාජිකයන් සඳහා මුදල් ඉල්ලුම් කරන්නේ නම් එම ගෙවීම සඳහා අවශ්‍යය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් නිකුත් කිරීමට එකඟත්වය පළකර තිබේ. |
| (ඉ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දිනට 36,399 ක් විය. නව බඳවා ගැනීම් නොකෙරෙන බැවින් වර්තමානයේ සිටින සියලු දෙනා විශ්‍රාම යාමෙන් පසු 2058 වර්ෂයේදී දෙපාර්තමේන්තුව අහෝසිවී යාමට නියමිතය. බදු පදනමට ලබා ගත් ඉඩම තුළ ඉදිකරන ගොඩනැගිලි හා දේපල වර්ෂ 30 කට පසු බදුකරු වෙත නැවත හිමි වන බැවින් ඉදිරි අනාගතය තුළදී දෙපාර්තමේන්වේ කාර්යභාරයේ අවශ්‍යතාවය තව දුරටත් පැන නැගුණ හොත් එවැනි | ආයතනයේ ඉදිරි පැවැත්ම පිළිබඳව සලකා බලා ක්‍රියා කළ යුතු වීම. | වර්තමානයේ දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිළධාරින් වෙනත් ආයතන වෙත අනුයුක්ත කිරීමට වැඩ කටයුතු කරමින් පවතින අතර අවශ්‍යයතාවයක් වුවහොත් ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කළ හැකි වේ. |

අවස්ථාවකදී මෙවැනි ගොඩනැගිලිවල අවශ්‍යතාවය සපුරා ගැනීමට යාම පිළිබඳව අවදානමක් නිරීක්ෂණය විය.

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තු බලකායන්හි අවශ්‍යතාවයන් සඳහා කෘෂි උපකරණ වර්ග 25 ක් විවිධ ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීම සඳහා රු.3,675,775 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු නමුත් උපකරණ වර්ග 15 ක සත්‍ය මිල ගණන් ඇස්තමේන්තු කල මිලට වඩා සියයට 70 සිට සියයට 276 දක්වා පරාසයක ඉහල අගයන් වූ බව නිරීක්ෂණය විය. තවද, අවශ්‍යතාවයන් අනුව හඳුනාගත් උපකරණ වර්ග 4 ක් මිලදී ගැනීමෙන් ඉවත් කර තැබීමටත් උපකරණ වර්ග 02 ක් සැලසුම් කල ප්‍රමාණයට වඩා අඩුවෙන් මිලදී ගැනීමටත් කටයුතු කර තිබුණි. | සත්‍ය අවශ්‍යතාවයන් සලකා බලා ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට කටයුතු කල යුතුය. | ඇස්තමේන්තු සකස් කර ඇත්තේ 2016 වර්ෂයේ වන අතර 2017 වර්ෂයේදී යකඩ සහ වානේ මිල ගණන් ඉහලයාම සහ අනෙකුත් කෘෂි උපකරණ වෙළඳපොළ මිල ගණන් ඉහල යාම හේතුවෙන් ඇස්තමේන්තු මිල සහ සත්‍ය මිල අතර, විචලනයක් සිදු වී තිබුණි. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 කරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 ට අනුව සෑම මුදල් වර්ෂයකම මාර්තු 15 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කල යුතු වුවත් 2018 මූල්‍ය වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් | නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ පවත්වා මූල්‍ය හා වෙනත් වාර්තා යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. | දෙවන කාල රාමුවට අයත් ආයතනයක් නිසා ජූනි 30 ට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

| | | |
|---|---|---|
| පත්කර තිබුණු සමීක්ෂණ මණ්ඩල 35ක් අතුරින් 2019 අප්‍රේල් 30 දින වනවිට සමීක්ෂණ මණ්ඩල 04ක් පමණක් සිය කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | | |

**3.5 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------- | ------------- | ---------------------------- |
| ආරක්ෂක හටයින් සඳහා නව නිළ ඇඳුම් සැපයීම සඳහා මිලදී ගෙන තිබුණු රු. 757,620 වටිනා කමිස රෙදි මීටර 3,294 ක්, රු.2,658,960 ක් වටිනා කලිසම් රෙදි මීටර 7,386 ක් සහ රු. 5,361,230 ක් වටිනා මසා නිම කර තිබුණු ඇඳුම් කට්ටල 2,641 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 කට වැඩි කාලයක් තිස්සේ ගබඩා තුළ උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. නව නිල ඇඳුම් ලබා ගැනීම සඳහා නිලධාරීන් වෙත උනන්දුවක් නොතිබීම හේතුවෙන් මෙම රෙදි තොග ඌණ උපයෝජිතව පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදී ගත් නිළ ඇඳුම් සහ රෙදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | නව නිල ඇඳුම් හඳුන්වා දුන් පසු එම නිළ ඇඳුම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන ප්‍රධානීන් කිහිප දෙනෙකුම අකමැත්ත ප්‍රකාශ කිරීම හේතුවෙන් බෙදා හැරීම නවත්වා ඇත. රටේ ආරක්ෂක තත්වය යහපත් වීමෙන් පසුව මෙම නිළ ඇඳුම නැවත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරණු ලැබේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------- | ------------- | ---------------------- |
| (අ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සිවිල් ආරක්ෂක | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අදාල පරිදි ක්‍රියා කල යුතුය. | 2018 වර්ෂය සඳහා හඳුනා ගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලු අතර ප්‍රතිපාදන වෙන් නොවූ |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී තිබුණි. නමුත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ගැන උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | | බැවින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. |
| **(ආ)** | දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගනු ලැබූ තිරසර සංවර්ධන දර්ශක සඳහා සියලු පාර්ශවයන් නියෝජනය වන පරිදි දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි. නමුත් දත්ත එක්රැස් කිරීමේ කාර්යය සඳහා නිලධාරීන් යෙදවීමට අපේක්ෂා කරන බවත්, ඉදිරි වැඩ සටහන් සැලසුම් අදියරේ පවතින බවටත්, කරුණු අනාවරණය විය. | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අදාල පරිදි ක්‍රියා කල යුතුය. | 2018 වර්ෂය සඳහා හඳුනා ගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලූ අතර ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2018දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------- | ------------- | ---------------------- |
| (පහත වගුව බලන්න) | - | මෙම දෙපාර්තමේන්තුව සඳහා අලුතින් බඳවා ගැනීම් සිදු නොකෙරේ. |

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| i | ජ්‍යෙෂ්ඨ | 23 | 15 | 8 | 0 |
| ii | තෘතියික | 84 | 48 | 36 | 0 |
| iii | ද්විතියික | 126 | 38 | 88 | 0 |
| iv | ප්‍රාථමික | 39,960 | 36,546 | 3,414 | 0 |
| V | අනියම්/ කොන්ත්‍රාත් | 0 | 1 | 0 | 1 |
| | **එකතුව** | 40,193 | 36,648 | 3,546 | 1 |

2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 40,193 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 36,648 ක් වූයෙන් පුරප්පාඩු 3,546 ක් විය. එම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ 8 ක්ද තෘතියික මට්ටමේ 36 ක්ද ද්විතියික මට්ටමේ 88 ක්ද ප්‍රාථමික මට්ටමේ 3,414 ක් විය.